# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,879/16 — 1969 නොවැම්බර් 30 වැනි ඉරිද — 1969.11.30

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඩ කරන ලදී)


# III වැනි කොටස—ඉඩම්

## ඉඩම් රජයට ගැනීම් පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වෙනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

1969 අංක 396 දරණ ආඥාව

යොමු අංකය : ජේ 68/69 අයි 534 / කිව. ඒ. 953

1964 අංක 28 දරණ ඉඩම අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වෙනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, පහත සඳහන් උපලේඛනයේ I වෙනි තීරයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත් එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියාට එම උපලේඛනයේ II වෙනි තීරයේ අනුරූප සටහනේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

සී. පී. ද සිල්වා,
ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

කොළඹ, 1969 නොවැම්බර් මස 29 වෙනි දින.

### උපලේඛනය

| I<br>ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා | II<br>ඉඩමේ විස්තරය |
|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ඉඩම් නිළධාරි ... | කොළඹ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ දකුණ ''ඒ'' ප්‍රාදේශිය ආදයම් නිළධාරි කොට්ඨාශයේ, රාගම් පත්තුවේ, ඒකල කුරුඳුවත්තේ පිහිටි ගල්ලවත්ත නමැති ඉඩමෙන් අක්කර 13 රූඩ 3 පර්චස් 29 ක් විශාල පහත සඳහන් මායිම් තුළවූ කොටස :—<br>උතුරට : ආර්ලිස් සිල්වා, ස්ටැන්ලි ද මෙල් දෙස්තර මහතා, ඩබ්ලිව්. ඊ. සිල්වා, ඩබ්ලිව්. ඇල්. සිල්වා, එච්. ඩී. සිල්වා සහ ඇලෙක්ස් අබෙසිංහ යන අය හිමිකම් කියන ගල්ලවත්ත සහ ඇල ;<br>නැගෙනහිරට : රජයට අයිති, විදුලි කම්බි සඳහා වූ රක්ෂිත වනය ;<br>දකුණට : එම ඉඩමේම ඉතිරි කොටස ;<br>බස්නාහිරට : ලංකා රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථාව හිමිකම් කියන ඒකල නමැති ඉඩම. |

11—1023


ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි

ජේ 9016—5,550 (69/11)